# ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය - 2016


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## වැදගත් කරුණු

ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය පෙර වසරේ වාර්තා කළ 0.685 ක අගයේ සිට, 2016 වසරේ දී 0.746 දක්වා වර්ධනය විය. මේ සඳහා ආර්ථික හා ව්‍යාපාර පරිසරය සහ ජනජීවිතයේ යහ පැවැත්ම මනිනු ලබන උපදර්ශකවල ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

පළාත්බද ශ්‍රේණිගත කිරීම් තුළ බස්නාහිර පළාත ප්‍රථම ස්ථානයේ රැඳී සිටින අතර පිළිවෙලින් දකුණු, මධ්‍යම සහ උතුරු මැද පළාත් දෙවෙනි, තෙවෙනි සහ සිව්වැනි ස්ථාන හිමි කරගෙන තිබේ.

සමස්ත සෞභාග්‍ය දර්ශකයේ ඉහළම වර්ධනය වයඹ පළාතෙන් වාර්තා වූ අතර උප-දර්ශක තුනෙහිම වැඩිදියුණු වීම මේ සඳහා දායක වී ඇත.




## ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය - 2016

සමස්ත රටෙහි සහ එහි පළාත්වල සෞභාග්‍ය තත්ත්වය මැනීම සහ සැසඳීම සිදු කරනු ලබන බහුමාන දර්ශකයක් වන ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය[1] පෙර වසරේ වාර්තා කළ 0.685 ක අගයේ සිට, 2016 වසරේ දී 0.746 දක්වා වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයේ උපදර්ශකයන්ගේ හැසිරීම විශ්ලේෂණය කිරීමේ දී 2015 වසරේ සිට 2016 වසර දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය සහ ජන ජීවිතයේ යහපැවැත්ම මනිනු ලබන උපදර්ශක වර්ධනය වූ අතර සමාජ ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය සුළු වශයෙන් අඩු විය.

**සංඛ්‍යා සටහන 1 - ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සහ උපදර්ශක 2015 – 2016**

| වර්ෂය | ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය | ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය | ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය | සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය |
|---|---|---|---|---|
| 2015 | 0.685 | 0.871 | 0.625 | 0.558 |
| 2016 | 0.746 | 0.915 | 0.812 | 0.510 |


සේවා නියුක්ති අනුපාතිකය, අවිධිමත් අංශයේ වැටුප්, කර්මාන්තශාලා ඝනත්වය සහ බැංකු ශාඛා ඝනත්වය යනාදියෙහි වැඩි වීම ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකයේ ඉහළ යාමට දායක විය. ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය වැඩි දියුණු වීම සඳහා සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා එය ලබාගැනීමට ඇති හැකියාව, මහජනතාවගේ වත්කම් සහ විනෝදය සඳහා වූ පහසුකම් පැවතීම හා භාවිතය යනාදියෙහි වැඩිවීම මූලික වශයෙන් හේතු විය. සමාජ ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයේ මධ්‍යස්ථ හැසිරීම කෙරෙහි නළ ජලයේ ගුණාත්මකභාවය අඩු වීම, ප්‍රජා කටයුතු සඳහා කාන්තා දායකත්වය අඩු වීම සහ ප්‍රවාහන පහසුකම් සඳහා වූ ප්‍රවේශයන් පහත වැටීම බලපාන ලදි. කෙසේ නමුත්, මෙම උපදර්ශකයෙහි ඇතුළත් මහා මාර්ග ව්‍යාප්තිය, විදුලිය, අපරාධ වලින් තොර පරිසරයක් පැවතීම සහ පාසල් තුල තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් පැවතීම යන අංශයන්හි යම් පමණක වර්ධනයක් දක්නට ලැබිණි.

[1] ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය, “ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය”, “ජන ජීවිතයේ යහ පැවැත්ම” සහ “සමාජ - ආර්ථික යටිතල පහසුකම්” යන උපදර්ශක තුනකින් සමන්විත වන අතර ඒවා පළාත්බද ආර්ථික සහ සාමාජීය සංවර්ධනය පිළිබිඹු කරනු ලබන නියෝජනාත්මක විචල්‍යයන් 43 ක් භාවිතයෙන් මනිනු ලැබේ.

## පළාත්බද සෞභාග්‍යය


සමස්ත පළාත්බද දර්ශකය තුළ බස්නාහිර පළාත 1.272 ක ඉහළම දර්ශක අගය සමග මෙවරත් ප්‍රථම ස්ථානය ලබා ඇති අතර, 2015 වසරට වඩා දර්ශක අගයන් 0.029 කින් වර්ධනය වීමක් දක්නට ලැබුණි. අනෙකුත් පළාත් සමග සැසඳීමේ දී බස්නාහිර පළාතේ සියලුම උපදර්ශක ඉහළ අගයක පැවතීම එහි ඉහළ ක්‍රියාකාරිත්වය සඳහා හේතු විය. සබරගමුව පළාත හැරුණු විට අනෙක් සියලුම පළාත්වල සමස්ත සෞභාග්‍ය දර්ශකය පෙර වසරට සාපේක්ෂව 2016 වසරේ දී වර්ධනය වී ඇත. සබරගමුව පළාතේ සමස්ත සෞභාග්‍ය දර්ශකය අඩුවීම සඳහා එහි සමාජ ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයේ අගය අඩුවීම හේතු වූ අතර 2016 වසරේ ඇති වූ ගංවතුර තත්ත්වය මත ජලයේ ගුණාත්මකභාවය අඩුවීම සහ අනෙකුත් සමාජ - ආර්ථික විචල්‍යයන්හි පසුබෑම මේ සඳහා යම් පමණකට දායක විය. නැගෙනහිර පළාත, පළාත්බද ශ්‍රේණිගත කිරීම්වලට අනුව 2016 වසරේ පැවති ස්ථානයේම පවතින නමුත් උපදර්ශකයන් තුනෙහිම සිදුවූ වර්ධනය සමගින් සමස්ත දර්ශකය, දර්ශක අගයන් 0.072 කින් වැඩි කර ගැනීමට සමත් වී ඇත. වයඹ පළාත, දර්ශක අගය 0.082 කින් වැඩි කරගනිමින් සමස්ත දර්ශකයේ වැඩිම වර්ධනය පෙන්නුම් කරයි. 2015 වසරේ සිට 2016 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්ත සෞභාග්‍ය දර්ශකයේ පළාත් නවයෙහි ශ්‍රේණිගත කිරීම් නොවෙනස්ව පැවතුණි.

**රූප සටහන 2 - සෞභාග්‍ය දර්ශකය 2015- 2016**





මධ්‍යම, උතුරු සහ දකුණු යන පළාත් හැරුනු කොට අනෙකුත් සියලුම පළාත්වල ක්‍රියාකාරිත්වය ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය යටතේ වර්ධනය වී ඇති අතර සියලු පළාත්වල ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශක අගයන්හි ඉහළ යාමක් වාර්තා විය. මේ අතර සමාජ ආර්ථික යටිතල පහසුකම් උපදර්ශක අගයන් මධ්‍යම, නැගෙනහිර, වයඹ හා බස්නාහිර පළාත්වල පමණක් ඉහළ ගොස් ඇත.


**රූප සටහන 3: ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය**




**රූප සටහන 4: ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය**[2]




**රූප සටහන 5: සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය**




[2] ලෙගටම් සෞභාග්‍ය දර්ශකය (Legatum Prosperity Index) ගණනය කිරීමේ ක්‍රමවේදය සමීපව අනුගමනය කරමින්, අදාළ විචල්‍යයන් සම්මතකරණයෙන් දර්ශක අගයන් සම්පාදනය කෙරේ. එම නිසා දර්ශක අගයේ සලකුණ මගින් අදාළ මධ්‍යනායට සාපේක්ෂව එහි ධන හෝ ඍණ වෙනස්වීම පිළිබිඹු කරන අතර දර්ශකයේ ඍණ අගයන් මගින් සෞභාග්‍ය තත්ත්වය ඍණ මට්ටමක පවතියැයි පිළිබිඹු නොවේ.

## පළාත්බද සෞභාග්‍යය දර්ශක අගයන් සහ ශ්‍රේණි

**සංඛ්‍යා සටහන 2 - පළාත් මට්ටමින් සමස්ත සෞභාග්‍ය දර්ශක, උපදර්ශක සහ පළාත්බද ශ්‍රේණි**

| දර්ශකය සහ පළාත | දර්ශක අගය | | පළාත්බද ශ්‍රේණිය | |
|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 |
| සමස්ත සෞභාග්‍ය දර්ශකය | | | | |
| මධ්‍යම | 0.370 | 0.450 | 3 | 3 |
| නැගෙනහිර | 0.062 | 0.135 | 9 | 9 |
| උතුරුමැද | 0.360 | 0.400 | 4 | 4 |
| වයඹ | 0.274 | 0.356 | 5 | 5 |
| උතුරු | 0.232 | 0.239 | 6 | 6 |
| සබරගමුව | 0.222 | 0.153 | 7 | 7 |
| දකුණු | 0.435 | 0.455 | 2 | 2 |
| ඌව | 0.133 | 0.151 | 8 | 8 |
| බස්නාහිර | 1.243 | 1.272 | 1 | 1 |
| ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය | | | | |
| මධ්‍යම | 0.514 | 0.490 | 2 | 4 |
| නැගෙනහිර | 0.221 | 0.333 | 8 | 6 |
| උතුරුමැද | 0.478 | 0.513 | 3 | 3 |
| වයඹ | 0.448 | 0.515 | 4 | 2 |
| උතුරු | 0.430 | 0.301 | 5 | 7 |
| සබරගමුව | 0.244 | 0.281 | 7 | 8 |
| දකුණු | 0.404 | 0.388 | 6 | 5 |
| ඌව | 0.129 | 0.181 | 9 | 9 |
| බස්නාහිර | 1.668 | 1.715 | 1 | 1 |
| ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය | | | | |
| මධ්‍යම | 0.181 | 0.300 | 6 | 6 |
| නැගෙනහිර | -0.066 | 0.036 | 9 | 9 |
| උතුරුමැද | 0.301 | 0.404 | 4 | 3 |
| වයඹ | 0.311 | 0.398 | 3 | 4 |
| උතුරු | 0.224 | 0.391 | 5 | 5 |
| සබරගමුව | 0.172 | 0.238 | 7 | 7 |
| දකුණු | 0.640 | 0.771 | 2 | 2 |
| ඌව | -0.013 | 0.143 | 8 | 8 |
| බස්නාහිර | 1.144 | 1.173 | 1 | 1 |
| සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය | | | | |
| මධ්‍යම | 0.415 | 0.561 | 2 | 2 |
| නැගෙනහිර | 0.032 | 0.036 | 9 | 7 |
| උතුරුමැද | 0.300 | 0.282 | 3 | 3 |
| වයඹ | 0.064 | 0.156 | 7 | 5 |
| උතුරු | 0.043 | 0.024 | 8 | 8 |
| සබරගමුව | 0.248 | -0.061 | 6 | 9 |
| දකුණු | 0.259 | 0.207 | 5 | 4 |
| ඌව | 0.284 | 0.129 | 4 | 6 |
| බස්නාහිර | 0.917 | 0.928 | 1 | 1 |

***අදාළ පුවත්පත් නිවේදනය පහත ඇමුණුමෙන් ලබා ගත හැක.***
http://www.cbsl.gov.lk/pics_n_docs/02_prs/_docs/press/press_20171205sx.pdf

### පළාත්බද සුවිශේෂී කාර්ය සාධනයන්

2015 වසරේ සිට 2016 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්ත සෞභාග්‍ය දර්ශකයේ පළාත් නවයෙහි ශ්‍රේණිගත කිරීම් නොවෙනස්ව පැවතුණි.

නැගෙනහිර පළාත, පළාත්බද ශ්‍රේණිගත කිරීම්හි 2016 වසරේ පැවති ස්ථානයේම පවතින නමුත් උපදර්ශකයන් තුනෙහිම සිදුවූ වර්ධනය නිසා සමස්ත දර්ශකය, දර්ශක අගයන් 0.072 කින් වැඩි කර ගැනීමට සමත් වී ඇත.

### ක්‍රියාපටිපාටිය සහ ක්‍රමවේදය

ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය යනු ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සම්පාදනය කරනු ලබන බහු මාන දර්ශකයකි. විචල්‍යයන් 43 කින් සමන්විත උපදර්ශක තුනක් මෙම දර්ශකය සැකසීමේ දී උපයෝගී කර ගැනේ. මෙහිදී සියලුම උපදර්ශක සඳහා සමාන බර තැබීමක් සිදු කර ඇති අතර එක් එක් උපදර්ශකය තුළ ඇති විචල්‍යයන් සඳහා ද සමාන බර තැබීමක් සිදු කර ඇත.

ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සැකසීමේ දී, ලෙගටම් සෞභාග්‍ය දර්ශකය ගණනය කිරීමේ ක්‍රමවේදයට ඉතා සමීප ක්‍රමවේදයක් 2014 වසරේ සිට භාවිතා කරනු ලබයි. මෙහිදී දර්ශක අගයන් ගණනය කරනු ලබන්නේ සෑම විචල්‍යයක්ම සම්මතකරණය කිරීමෙනි. එම නිසා දර්ශක අගයේ සලකුණ මගින් අදාළ මධ්‍යන්‍යයට සාපේක්ෂව එහි ධන හෝ ඍණ වෙනස්වීම පිළිබිඹු කරන අතර දර්ශකයේ ඍණ අගයන් මගින් සෞභාග්‍ය තත්ත්වය ඍණ මට්ටමක පවතීයැයි පිළිබිඹු නොවේ.

### ප්‍රකාශනය

වාර්ෂිකව